ද මැසිනොද් විදුහල, කඳාන

5 . 06 . 2016

# පුරවැසි අධ්‍යාපනය

පළමු වාර පරීක්ෂණය 2016 — 10 ශ්‍රේණිය

වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1) " නීතිය යනු රාජ්‍ය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පද්ධතියකි " මෙම ප්‍රකාශය සිදු කරනු ලැබුවේ

1. ඇරිස්ටෝටල් විසිනි
2. ටී. එච්. ග්‍රීන් විසිනි
3. ප්ලේටෝ විසිනි
4. ජෝන් ඔස්ටින් විසිනි

2) සෑම සමාජයක්ම පාලනය කල යුතු වන්නේ

1. යුක්තියට අනුවය
2. සදාචාරයට අනුවය
3. සත්‍යයට අනුවය
4. නීතියට අනුවය

3) ………………… ක්‍රියාත්මක වන්නේ නම් සමාජයක යුක්තිය සාමය සුරක්ෂිතභාවය යන ලක්ෂණ දැකිය හැක

1. අධිකරණයේ ස්වාධීනත්වය
2. නීතියේ ආධිපත්‍යය
3. ආචාර ධර්ම සහ වටිනාකම්
4. දේශපාලන නිදහස

4) නීතිය හා බැඳුනු අනෙක් ප්‍රධාන සංකල්පය වන්නේ

1. සත්‍යය
2. යුක්තියය
3. සදාචාරය
4. අයිතිවාසිකම්

5) කිසියම් රටක නීතිය මැනවින් ක්‍රියාත්මක වන්නේ නම්

1. සත්‍යගරුක සමාජයක් බිහිවේ
2. නීතිගරුක සමාජයක් බිහිවේ
3. යුක්තිගරුක සමාජයක් බිහිවේ
4. සාධාරණ සමාජයක් බිහිවේ

6) රාජ්‍යයක උත්තරීතර නීතිය වන්නේ

1. රටහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි
2. විවිධ අණපනත්ය
3. අධිකරණ තීන්දුය
4. නීති විශාරදයන්ගේ මතයන්ය

7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය මෙන්ම අපරාධ නීතිය හා සිවිල් නීතිය වශයෙන් ප්‍රධාන කොටස් වලට බෙදා දක්වා ඇත්තේ

1. අන්තර් ජාතික නීතියය
2. දේශීය නීතිය
3. විදේශීය නීතියය
4. දේශීය හා විදේශීය නීතියය

8) මුස්ලිම් නීතිය, විහාර හා දේවාලගම් පිළිබඳ නීතිය සකස් වී ඇත්තේ

1. සිරිත් විරිත් පදනම් කරගෙනය
2. විද්‍යාත්මක සිද්ධාන්ත පදනම් කරගෙනය
3. ආගම් පදනම් කරගෙනය
4. විවිධ අණපනත් පදනම් කරගෙනය

9) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පොදු නීතිය වන්නේ

1. රෝම ලන්දේසි නීතියයි
2. ඉංග්‍රීසි නීතියයි
3. පෘතුගීසි නීතියයි
4. උඩරට පහතරට නීතියයි

10) තේසවලාමේ යන්නෙහි අර්ථය වන්නේ

1. ද්‍රවිඩ වැසියන්ගේ චාරිත්‍රයන්ය
2. ද්‍රවිඩ වැසියන්ගේ සම්ප්‍රදායන්ය
3. භූමියේ චාරිත්‍රයය
4. මින් එකක්වත් පිළිගත නොහැක

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

1)
1. නීති යනු කුමක්ද?
2. නීති වර්ග කොට දැක්විය හැක්කේ කෙසේද?
3. ප්‍රධාන නීති මුලාශ්‍ර මොනවාද?

2)
1. ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය කුමක්ද?
2. මෙම නීතියට අමතරව ක්‍රියාත්මක වන වෙනත් විශේෂ නීති මොනවාද?
3. මේවා පිළිබඳව වෙන වෙනම විස්තර කරන්න

3)
1. ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධිකරණ ආයතන පිළිවෙලින් දක්වන්න
2. ශ්‍රේෂ්ඨාධිකරණය සතු ප්‍රධාන අධිකරණ බලතල මොනවාද?
3. අභියාචනාධිකරණය ෂතු බලතල අතුරින් බලතල දෙකක් දක්වන්න

4) පහත සඳහන් මාතෘකා පිළිබඳව වෙන වෙනම විස්තර කරන්න
1. අධිකරණ අමාත්‍යතුමා
2. අග්‍රවිනිශ්චයකාරතුමා
3. නීතිපතිතුමා

5) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳව විස්තර කරන්න
1. බේරුම්කරණය
2. ඔම්බුඩ්ස්මන්වරයා
3. මානව හිමිකම් කොමිසම
4. නීතියේ ආධිපත්‍යය

6)
1. අධිකරණයේ ස්වාධිනත්වය යනු කුමක්ද?
2. අධිකරණයේ ස්වාධිනත්වය ආරක්ෂා කරලිම සඳහා යොදා තිබෙන විධිවිධානයක් මොනවාද?

7) අප්‍රමාදව අපක්ෂපාතිව යුක්තිය ඉටු නොකිරීමෙන් අත්විය හැකි ප්‍රතිඵල මොනවාද?

8)
1. 1833, 1910, 1921 දි හඳුන්වා දුන් ව්‍යවස්ථාදායක සභා වල සංයුතිය දක්වන්න
2. එම ව්‍යවස්ථාදායක සභා වල දැකිය හැකි යහපත් සහ අයහපත් ලක්ෂණ මොනවාද?

පහත සඳහන් ප්‍රකාශ කියවා ඒවා නිවැරදි නම් හරි (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න

1. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ විනාශය ගැන විමසීමේදී එය රාජාණ්ඩු සමය දක්වා විහිදේ ( )
2. රාජකීය අධිකරණ පද්ධතියේ අවසාන අභියාචනාකරු වූයේ රජතුමාය ( )
3. පෘතුගීසින් විසින් පවත්වා ගෙන යනු ලැබුවේ පැරණි සිංහල අධිකරණ ක්‍රමයයි ( )
4. ලන්දේසි යුගයේදී කොළඹ යාපනය ගාල්ල යනුවෙන් ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුනක් ක්‍රියාත්මක නොවිය ( )
5. බ්‍රිතාන්‍ය පාලන සාමය තුළ ශ්‍රී ලංකාවේ ඉහළම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව එංගලන්ත රාජාධිකරණය වෙත අභියාචනා කළ නොහැකි විය ( )
6. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව ලංකාවේ අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ ආයතනය වන්නේ අභියාචනාධිකරණයයි ( )
7. ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පණත් මගින් අධිකරණ බලතල සහිත විනිශ්චය අධිකාරි හා ආයතන පිහිටුවා නැත ( )
8. තනි උසාවි පිහිටුවා ඇත්තේ හින්දු විවාහ ගැටළු විසඳීම සඳහාය ( )
9. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා වන්නේ නීතිපතිතුමාය ( )
10. ශ්‍රේෂ්ඨාධිකරණයට අමතරව පවතින් ජ්‍යෙෂ්ඨතම අධිකරණ ආයතනය වන්නේ අභියාචනාධිකරණයයි ( )

Learning Resource Center
R
De Mazenod College
Kandana

කෙටි පිළිතුරු සපයන්න

1. ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතිය තුළ ඉහළම අධිකරණ ආයතනය වන්නේ කුමක්ද?
2. ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතිය තුළ දැකිය හැකි පහළම අධිකරණ ආයතන මොනවාද?
3. අභියාචනාධිකරණයේ ප්‍රධානියා වන්නේ කවුරුන්ද?
4. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා වන්නේ කවුරුන්ද?
5. බරපතල අපරාධ සම්බන්ධ නඩු විසඳීමේ අධිකරණ බලය ද නාවුක අධිකරණ බලය හා වාණිජ අධිකරණ බලය ද හිමි වන්නේ කුමන අධිකරණයටද?
6. ලංකාවේ දිසා අධිකරණ පිහිටුවා ඇති දිස්ත්‍රික්ක ගණන කොපමණද?
7. ලංකාවේ මහේස්ත්‍රාත් උසාවි පිහිටුවා ඇති අධිකරණ කොට්ඨාස ගණන කොපමණද?
8. බේරුම්කරණය සිදුවන ආකාරය ප්‍රධාන කොටස් කියකට බෙදා දැක්විය හැකිද? ඒ මොනවාද?
9. ඔම්බුඩ්ස්මන්වරයා යනු කවුරුන්ද?
10. මෙම තනතුර හඳුන්වා දෙනු ලැබුවේ කුමන ව්‍යවස්ථාවේන්ද?